# වී ගොවිතැන ආශ්‍රිත සේවා නියුක්තිය කෙරෙහි නවීන තාක්ෂණය සිදු කරන බලපෑම

**පී. එන්. ඩී. ඒ. සෝමසිරි**[1]

**සංක්ෂේපය**

වර්තමානය වනවිට, බොහොමයක් වු මිනිස් ක්‍රියාකාරකම් පහසු කරගැනීම සඳහා නවීන තාක්ෂණය භාවිතා කරන ආකාරයක් දැකිය හැකිය. මෙම තත්ත්වය ශ්‍රී ලංකාවේ වී ගොවිතැන ආශ්‍රිතව බහුලව දැකගත හැකිය. විවිධ නිෂ්පාදන ආයතන වෙළඳපොළ තරගකාරීත්වයත් සමඟින් දිනෙන් දින නවීකරණය කරන ලද යන්ත්‍රෝපකරණ භාවිතය නිසාවෙන් ගැමි ජනතාවගේ රැකියා අවස්ථා අහිමි වීමක් වර්තමානය වන විට සිදු ව තිබේ. ග්‍රාමීය ජනතාවගේ සේවා නියුක්තිය කෙරෙහි මෙම නවීන යන්ත්‍රෝපකරණ භාවිතය බලපාන ආකාරය සෙවීම, මෙහි ප්‍රධාන අරමුණ වේ. ශ්‍රී ලංකාවේ ඉහළ යන රැකියා වියුක්ති අනුපාතය සඳහා නවීන තාක්ෂණයත් සමඟින් බිහි වන යන්ත්‍ර සූත්‍ර භාවිතය ඉහළ යාමද හේතු සාධක වී තිබෙන ආකාරයක් පැහැදිලි වේ. මේ පිළිබඳව සමීක්ෂණය කිරීමේදී, රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඉහළ වල්පොල ග්‍රාම නිලධාරී වසමේ පදිංචි වසර 28ක් හෝ ඊට වැඩි කාල වකවානුවක සිට වී ගොවිතැනෙහි නියැලෙන ගොවීන් පහසු නියැදීම යටතේ, තෝරා ගෙන සම්මුඛ සාකච්ඡා මාර්ගයෙන් තොරතුරු රැස් කර ගන්නා ලදී. මෙහි දී අතීතයේ පැවති තත්ත්වයන් තවදුරටත් අනාවරණය කර ගැනීම මෙම සමීක්ෂණයේ සාර්ථකත්වයට බලපාන හෙයින් ගොවි ජීවිතයේ අත්දැකීම් බහුල අවුරුදු 75 ඉක්මවූ පුද්ගලයන් ද මෙම සමීක්ෂණයට භාජනය කරන ලදී. ගොවීන් සමඟ සිදු කරනු ලද සම්මුඛ සාකච්ඡා තුළින් ලබා ගත් තොරතුරුවලින් පැහැදිලි වූයේ, නවීන යන්ත්‍ර සූත්‍ර භාවිතය හේතුවෙන් ගොවි ජනතාවගේ කටයුතු පහසු කළ ද එය වියදම් අධික ක්‍රමයක් බවයි. එමෙන්ම රජයේ හෝ පෞද්ගලික ආයතනයක හෝ ස්ථිර පදනම යටතේ හෝ තාවකාලික පදනම යටතේ හෝ සේවය නොකරන ගැමි ජනතාව කෘෂිකර්මාන්තය ආශ්‍රිතව කුලී වැඩ කරමින් මුදල් උපයා ගැනීමට තිබූ අවස්ථා ද අහිමි වී ඇති බැව් අනාවරණය විය. තවද, මෙම හේතු සාධක පදනම් කරගෙන ගොවි ජනතාව ද කෘත්‍රිම යන්ත්‍ර සූත්‍ර බවට පත්ව තිබේ. එය ගොවි ජනතාවගේ සෞඛ්‍යයට අහිතකර තත්ත්වයක් නිර්මාණය කරන බව හා ගම තුළ තිබූ ගොවි ජනතාව අතර ගොඩ නැඟී තිබුණා වූ එකමුතුකමත්, සාමූහිකත්වයත් බිඳ වැටීමට හේතු සාධක වී ඇති බවත් පැහැදිලි වේ.

**මුඛ්‍ය පද :** වී ගොවිතැන, නවීන යන්ත්‍ර සූත්‍ර, රැකියා

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, nimanthisomasiri@gmail.com.